පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 17/05/2024 පැය 1100

# මාධ්‍ය නිවේදනය

## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.05.16 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 24 | 0.75 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත බලපත්‍ර නොමැති ගිනි අවි 01 ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණ කඳවුර.**

2024.05.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නින්දවූර් පොලිස් වසමේ මුත්තුපාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත බලපත්‍ර නොමැති ගිනි අවි 01ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන නින්දවූර් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 34ක් වූ තිරුක්කෝවිල් ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ. නින්දවූර් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. ගංජා පැළ සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.05.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තණමල්විල පොලිස් වසමේ හම්බේගමුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **ගංජා පැළ 3718 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 40ක් වූ හම්බේගමුව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**